# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**2024 පෙබරවාරි මස 09 වන දින**

**II වන කොටස**

**අතිරේකය**

**(2024.02.13 දින නිකුත් කරන ලදී)**


## දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන)

**(19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහය සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගේ නියමය පරිදි පළකරන ලදී


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 18.00 තැපැල් ගාස්තුව : රු. 150.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ 363 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වගන්තියේ නීතිය බලපෑම වනුයේ ඒ වගන්තියේ විධිවිධාන අදාළ වීම ස්ත්‍රී වින්දිතයන්ට මෙන්ම පුරුෂ වින්දිතයන්ටද ව්‍යාප්ත කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

***3 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 364 වන වගන්තිය ප්‍රතියෝජනය කරනු ලබන අතර, සංශෝධනයේ නීතිය බලපෑම වනුයේ-

(අ) වයස අවුරුදු විසි දෙකකට අඩු වරදකරුවකු සහ වයස අවුරුදු දාහතරක් හෝ ඊට වැඩි වූ ද එහෙත් අවුරුදු දහසයකට අඩු වූ ද වින්දිතයකු අතර සමීප සම්බන්ධතාවක් පැවත ඇත්තා වූ ද, ලිංගික ප්‍රවේශනය සිදු කර ඇත්තේ වින්දිතයාගේ කැමැත්ත ඇතිව වූ ද අවස්ථාවක, විධානාත්මක අවම දණ්ඩනය වෙනුවට අත්හිටවූ දණ්ඩනයක් නියම කිරීම සඳහා අධිකරණයට හැකි කරවීම; සහ

(ආ) වයස අවුරුදු විසි දෙකකට අඩු වරදකරුවකු සහ වයස අවුරුදු දාහතරක් හෝ ඊට වැඩි වූ ද එහෙත් අවුරුදු දහසයට අඩු වූ ද වින්දිතයකු අතර සමීප සම්බන්ධතාවක් පැවත ඇත්තා වූ ද, ලිංගික ප්‍රවේශනය සිදු කර ඇත්තේ වින්දිතයාගේ කැමැත්ත ඇතිව බව ඔප්පු කිරීම සඳහා සාක්ෂි නොමැති වූ ද අවස්ථාවක, විධානාත්මක අවම දණ්ඩනයට වඩා අඩු දණ්ඩනයක් නියම කිරීම සඳහා අධිකරණයට හැකි කරවීම,

සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

එල්.ඩී.-ඕ 10/2021

## (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහය සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

1. මේ පනත 2024 අංක    දරන දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය

2. (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ 363 වන වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :- 19 වන අධිකාරයේ 363 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) ඒ වගන්තිය, ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ලෙස නැවත අංකනය කිරීමෙන්;

(2) නැවත අංකනය කරන ලද ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ -

(අ) "යම් මිනිසෙක් පහත විස්තර කර ඇති අවස්ථා අතරින් යම් අවස්ථාවකට අයත්වන පරිවේෂණ යටතේ, ස්ත්‍රියක සමග මෛථුනයෙහි යෙදේ නම් ඔහු "ස්ත්‍රී දූෂණය" සිදු කළේ යයි කියනු ලැබේ:-" යන වචන වෙනුවට "(මේ වගන්තියේ "වරදකරු" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් තැනැත්තකු පහත විස්තර කර ඇති අවස්ථා අතරින් යම් අවස්ථාවකට අයත්වන පරිවේෂණ යටතේ (මේ වගන්තියේ "වින්දිතයා" යනුවෙන් සඳහන් කරනු ලබන) වෙනත් යම් තැනැත්තකුට ලිංගික ප්‍රවේශන ක්‍රියාවක් සිදු කරන්නේ නම්, එම තැනැත්තා "පුද්ගල දූෂණය" සිදු කළේ යයි කියනු ලැබේ:-" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) එහි (අ) ඡේදයේ "ඒ ස්ත්‍රිය තමාගේ භාර්යාව වන අවස්ථාවක වුව ද ඇය ඔහුගෙන් නීති මාර්ගයෙන් වෙන් වී සිටිය දී ඇගේ කැමැත්ත නොමැතිව;" යන වචන වෙනුවට "වින්දිතයා වරදකරුගේ

භාර්යාව වන අවස්ථාවක වුව ද ඇය ඔහුගෙන් නීති මාර්ගයෙන් වෙන් වී සිටිය දී වින්දිතයාගේ කැමැත්ත නොමැතිව" යන වචන ආදේශ කිරීමෙන්;

(ඇ) එහි (ආ) ඡේදයේ "බලහත්කාරය පාවිච්චි කිරීමෙන් හෝ බිය ගැන්වීමෙන් හෝ රඳවා ගැනීමේ තර්ජනයෙන් හෝ ඇයට මරණ භය හෝ තුවාල සිදු කිරීමේ භය ඇති කිරීමෙන් හෝ ඇය නීත්‍යානුකූල හෝ නීතිවිරෝධී ලෙස රඳවා ගෙන සිටිය දී හෝ ඇයගේ කැමැත්ත ලබා ගෙන ඇති අවස්ථාවක, ඇගේ කැමැත්ත ඇතිව;" යන වචන වෙනුවට "බලහත්කාරය පාවිච්චි කිරීමෙන් හෝ බිය ගැන්වීමෙන් හෝ රඳවා ගැනීමේ තර්ජනයෙන් හෝ වින්දිතයාට මරණ භය හෝ තුවාල සිදු කිරීමේ භය ඇති කිරීමෙන් හෝ වින්දිතයා නීත්‍යානුකූල හෝ නීතිවිරෝධී ලෙස රඳවාගෙන සිටිය දී වින්දිතයාගේ කැමැත්ත ලබාගෙන ඇති අවස්ථාවක, වින්දිතයාගේ කැමැත්ත ඇතිව;" යන වචන ආදේශ කිරීමෙන්;

(ඈ) එහි (ඇ) ඡේදයේ "ඇය සිහිවිකලව සිටිය දී හෝ ඒ පුරුෂයා විසින් නැතහොත් වෙනත් යම් තැනැත්තකු විසින් ඇයට දෙන ලද මද්‍යසාර හෝ මත්ද්‍රව්‍ය මගින් ඇති කරන ලද මත් අවස්ථාවක ඇය සිටිය දී, ඇගේ කැමැත්ත ඇතිව;" යන වචන වෙනුවට "වින්දිතයා සිහිවිකල්ව සිටිය දී හෝ වරදකරු විසින් නැතහොත් වෙනත් යම් තැනැත්තකු විසින් වින්දිතයාට දෙන ලද මද්‍යසාර හෝ මත්ද්‍රව්‍ය මගින් ඇති කරන ලද මත් අවස්ථාවක වින්දිතයා සිටිය දී, වින්දිතයාගේ කැමැත්ත ඇතිව;" යන වචන ආදේශ කිරීමෙන්;

(ඉ) එහි (ඈ) ඡේදයේ "තමා ඇගේ ස්වාමිපුරුෂයා නොවන බව ඒ පුරුෂයා දැන සිටි අතර ඇගේ කැමැත්ත දෙන ලද්දේ ඇය හා නීත්‍යානුකූලව විවාහ වී සිටින හෝ ඇය හා නීත්‍යානුකූලව විවාහ වී ඇතැයි ඇය විශ්වාස කරන වෙනත් පුරුෂයකු ඒ පුරුෂයා යයි ඇය විශ්වාස කිරීම නිසා බව පුරුෂයා දන්නා විටක දී, ඇගේ කැමැත්ත ඇතිව;" යන

වචන වෙනුවට "ස්ත්‍රී වින්දිතයකු සම්බන්ධයෙන් වන විට, තමා ඇගේ ස්වාමිපුරුෂයා නොවන බව වරදකරු දැන සිටි අතර ඇගේ කැමැත්ත දෙන ලද්දේ ඇය හා නීත්‍යානුකූලව විවාහ වී සිටින හෝ ඇය හා නීත්‍යානුකූලව විවාහ වී ඇතැයි ඇය විශ්වාස කරන වෙනත් පුරුෂයකු තමා යැයි ඇය විශ්වාස කිරීම නිසා බව වරදකරු දන්නා විටක දී ඇගේ කැමැත්ත ඇතිව;" යන වචන ආදේශ කිරීමෙන්ත හෝ

(ඊ) එහි (ඉ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:-

"(ඉ) වින්දිතයා වයස අවුරුදු දහසයට අඩුවන අවස්ථාවක, වින්දිතයාගේ කැමැත්ත ඇතිව හෝ නැතිව.";

(3) ඒ නැවත අංකනය කරන ලද (1) වන උපවගන්තියේ පැහැදිලි කිරීම ඉවත් කිරීමෙන්;

(4) නැවත අංකනය කරන ලද ඒ වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය එකතු කිරීමෙන්:-

"(2) මේ වගන්තියේ "ලිංගික ප්‍රවේශනය යන්නෙන්, වරදකරුගේ ලිංගේන්ද්‍රිය මගින් වින්දිතයාගේ ලිංගේන්ද්‍රිය තුළට හෝ ඉන් ඔබ්බට, ගුද මාර්ගය තුළට හෝ මුඛය තුළට කවර හෝ ප්‍රමාණයකට ප්‍රවේශනයක් සිදු කරන යම් ක්‍රියාවක් අදහස් වේ.

පැහැදිලි කිරීම -

ශරීරයට සිදු වී ඇති ශාරීරික තුවාල වැනි ප්‍රතිරෝධය පෑම පිළිබඳ සාක්ෂි ලිංගික ප්‍රවේශනය සිදුකර ඇත්තේ කැමැත්ත නොමැතිව බව ඔප්පු කිරීම සඳහා අත්‍යවශ්‍ය නොවේ.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 364 වන වගන්තිය මෙයින් ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:- (ප්‍රධාන ප්‍රඥප්තියේ 364 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම)

"පුද්ගල දූෂණයට දඬුවම

364. (1) (මේ වගන්තියේ "වින්දිතයා" යනුවෙන් සඳහන් කරනු ලබන) වෙනත් යම් තැනැත්තකු පුද්ගල දූෂණය කරනු ලබන (මේ වගන්තියේ "වරදකරු" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් තැනැත්තකුට,

(2) වන සහ (3) වන උපවගන්තිවල විධිවිධාන සලස්වා ඇති අවස්ථාවල දී හැර, අවුරුදු හතකට නොඅඩු වූ ද අවුරුදු විස්සක් නොඉක්මවන්නා වූ ද කාලයකට බරපතල වැඩ ඇතිව බන්ධනාගාරගත කිරීමකින් ද දඩයකින් ද දඬුවම් කරනු ලැබිය යුතු ය. තවද, ඊට අමතරව, වින්දිතයාට සිදු වූ හානි වෙනුවෙන් අධිකරණය විසින් නිශ්චය කරනු ලබන මුදලක වන්දියක් වින්දිතයාට ගෙවන ලෙස ද අධිකරණය විසින් වරදකරුට ආඥා කරනු ලැබිය යුතු ය.

(2) යම් වරදකරුවකු -

(අ) රජයේ නිලධරයකුව හෝ බලය ඇති තත්ත්වයක් දරන තැනැත්තකුව සිටිමින් එකී නිල තත්ත්වය ප්‍රයෝජනයට ගෙන තමාගේ නිල රැකවරණයෙහි සිටින වින්දිතයෙක් පුද්ගල දූෂණය කළහොත් හෝ අයුතු ලෙස අවහිර කර එම වින්දිතයා පුද්ගල දූෂණය කළහොත්;

(ආ) නීතිය මගින් හෝ නීතිය යටතේ හෝ පිහිටුවන ලද රැඳවුම් නිවාසයක හෝ අත්අඩංගුවේ තබා ගන්නා වෙනත් ස්ථානයක නැතහොත් කාන්තා හෝ ළමා ආයතනයක කළමනාකාරීත්වයේ හෝ කාර්ය මණ්ඩලයේ නියුතු තැනැත්තකුව සිටිමින්, තමාගේ තත්ත්වය ප්‍රයෝජනයට ගෙන ඒ රැඳවුම් නිවාසයේ, අත්අඩංගුවේ තබා ගන්නා ස්ථානයේ හෝ ආයතනයේ යම් නේවාසිකයෙක් පුද්ගල දූෂණය කළහොත්;

(ඇ) රෝහලක කළමනාකාරීත්වයේ හෝ කාර්ය මණ්ඩලයේ නියුතු තැනැත්තකුව සිටිමින්, තමාගේ තත්ත්වය ප්‍රයෝජනයට ගෙන ඒ රෝහලේ සිටින වින්දිතයෙක් පුද්ගල දූෂණය කළහොත්;

(ඈ) ඇය ගර්භණී බව දැන දැනම ස්ත්‍රී වින්දිතයෙක් පුද්ගල දූෂණය කළහොත්;

(ඉ) වයස අවුරුදු දහඅටට අඩු වින්දිතයෙක් පුද්ගල දූෂණය කළහොත්;

(ඊ) මානසික වශයෙන් හෝ ශාරීරික වශයෙන් ආබාධිත වින්දිතයෙක් පුද්ගල දූෂණය කළහොත්; හෝ

(උ) රංචු ගැසී පුද්ගල දූෂණය කළහොත්,

එම වරදකරුට අවුරුදු දහයකට නොඅඩු වූ ද අවුරුදු විස්සක් නොඉක්මවන්නා වූ ද කාලයකට බරපතල වැඩ ඇතිව බන්ධනාගාරගත කිරීමකින් ද දඩයකින් ද දඬුවම් කරනු ලැබිය යුතු ය. තවද, ඊට අමතරව, වින්දිතයාට සිදු වූ හානි වෙනුවෙන් අධිකරණය විසින් නිශ්චය කරනු ලබන මුදලක වන්දියක් එකී වින්දිතයාට ගෙවන ලෙස ද අධිකරණය විසින් වරදකරුට ආඥා කරනු ලැබිය යුතු ය:

එසේ වුවද, 363 වන වගන්තිය යටතේ වන වරදක්, එම වරද සිදු කරන ලද අවස්ථාවේ දී වයස අවුරුදු විසිදෙකට අඩු වරදකරුවකු විසින් වයස අවුරුදු දාහතරක් හෝ ඊට වැඩි වූ ද, එහෙත් අවුරුදු දහසයට අඩු වූද, වින්දිතයකු සම්බන්ධයෙන් සිදු කරනු ලැබූ අවස්ථාවක -

(අ) ලිංගික ප්‍රවේශනය සිදු කර ඇත්තේ වින්දිතයාගේ කැමැත්ත ඇතිව බවට අධිකරණය සෑහීමට පත්වන පරිදි පෙනී යන අවස්ථාවක, අධිකරණය විසින්, වරදකරු කරනු ලැබූ විට, අවුරුදු දහයකට අඩු කාලයකට බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයක් නියම කරනු ලැබිය හැකි ය:

එසේ වුවද, අධිකරණය විසින්, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 303 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, උචිත අවස්ථාවල දී, මේ ඡේදය යටතේ නියම කරන ලද බන්ධනාගාරගත කිරීමේ කාලසීමාව අත්හිටුවනු ලැබිය හැකි ය; හෝ

(ආ) ලිංගික ප්‍රවේශනය සිදුකර ඇත්තේ වින්දිතයාගේ කැමැත්ත ඇතිව බවට අධිකරණය සෑහීමට පත්වන පරිදි ඔප්පු කිරීම සඳහා ප්‍රමාණවත් සාක්ෂියක් නොමැති අවස්ථාවක, අධිකරණය විසින්, අවුරුදු දහයකට නොඅඩු වූ ද අවුරුදු විස්සක් නොඉක්මවන්නා වූ ද කාලයකට බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයක් ද දඩයක් ද නියම කරනු ලැබිය යුතු ය. තවද, ඊට අමතරව, එම වින්දිතයාට සිදු වූ හානි වෙනුවෙන් අධිකරණය විසින් නිශ්චය කරනු ලබන මුදලක වන්දියක් එම වින්දිතයාට ගෙවන ලෙස ද අධිකරණය විසින් වරදකරුට ආඥා කරනු ලැබිය යුතු ය.

පැහැදිලි කිරීම 1

තැනැත්තන් කණ්ඩායමක එක් තැනැත්තකු හෝ ඊට වැඩි තැනැත්තන් සංඛ්‍යාවක් විසින් පුද්ගල දූෂණය පිළිබඳ වරද සිදු කරනු ලැබූ අවස්ථාවක, ඒ වරද සිදු කළ හෝ වරද සිදු කිරීමෙහි ලා අනුබල දුන් ඒ කණ්ඩායමේ එක් එක් තැනැත්තා රංචු ගැසී පුද්ගල දූෂණය සිදු කළේ යයි සලකනු ලැබේ;

පැහැදිලි කිරීම 2

"කාන්තා හෝ ළමා ආයතනය" යන්නෙන්, කවර ආකාරයකින් විස්තර කරනු ලබන්නේ වුව ද, ස්ත්‍රීන් හෝ ළමයින් භාර ගැනීම සහ රැකබලා ගැනීම සඳහා වූ ආයතනයක් අදහස් වේ;

පැහැදිලි කිරීම 3

"රෝහල" යන්නෙන්, රෝහලේ සීමා ඇතුළත පිහිටි ප්‍රදේශය අදහස් වන අතර ඊට රෝගෝපගතව සිටින තැනැත්තන් හෝ වෛද්‍ය උපස්ථානය හෝ පුනරුත්ථාපනය අවශ්‍ය තැනැත්තන් භාර ගැනීම සහ ඔවුන්ට ප්‍රතිකාර කිරීම සඳහා වූ යම් ආයතනයක සීමාව ඇතුළත පිහිටි ප්‍රදේශය ද ඇතුළත් වේ;

පැහැදිලි කිරීම 4

"හානි" යන්නට මනෝවිද්‍යාත්මක හෝ මානසික කම්පනය ද ඇතුළත් වේ.

(3) වයස අවුරුදු දහසයට අඩු වූ ද 364අ වන වගන්තියෙහි වෙන් වෙන් වශයෙන් දක්වා ඇති ප්‍රමාණවල ඥාති සම්බන්ධතා අතුරින් යම් ඥාති සම්බන්ධතාවක් වරදකරු කෙරෙහි ඇත්තා වූ ද යම් වින්දිතයකු පුද්ගල දූෂණය කරන යම් වරදකරුවකුට, වරදකරු කරනු ලැබූ විට, අවුරුදු පහළොවකට නොඅඩු වූ ද අවුරුදු විස්සක් නොඉක්මවන්නා වූ ද කාලයකට බරපතල වැඩ ඇතිව බන්ධනාගාරගත කිරීමකින් ද දඩයකින් ද දඬුවම් කරනු ලැබිය යුතු ය.

(4) යම් වරදකරුවකු විසින් (1) වන උපවගන්තිය හෝ (2) වන උපවගන්තිය යටතේ ගෙවන ලෙස එකී වරදකරුට ආඥා කරන ලද වන්දි මුදල ගෙවීම පැහැර හරිනු ලැබූ අවස්ථාවක, (1) වන උපවගන්තිය හෝ (2) වන උපවගන්තිය යටතේ එම වරදකරුට නියම කරන ලද බන්ධනාගාරගත කිරීමට අතිරේකව අවුරුදු දෙකක් දක්වා දීර්ඝ විය හැකි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක වැඩිදුරටත් වූ බන්ධනාගාරගත කිරීමකින් ද එම වරදකරුට දඬුවම් කරනු ලැබිය යුතු ය.”.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

4. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.